# මොරටුව විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව

## පුරප්පාඩු

මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය තනතුර

අවශ්‍ය සුදුසුකම් :

1. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) හෝ ඊ හා සමාන සුදුසුකම් ලබා තිබීම.

   හෝ

2. ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

   හෝ

3. අදාල විෂය ක්ෂේත්‍රය පිළිබඳ වන උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

   හෝ

4. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාලව වසර දෙකක පූර්ණ කාලීන ඩිප්ලෝමාව සමග අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

**සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රයන්හි සුදුසුකම් සපුරාලන අය කෙරෙහි ප්‍රමුඛත්වය දෙනු ලැබේ.**

•• වැටුප් ක්‍රමය : U-MT 1(II) : රු. 35,145-7x355;9x495-42,085/- (මාසික)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

**තෝරා ගන්නා ක්‍රමය : ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි**

### 02. හෙද නිලධාරිනී 11 ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් :

1 අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන 03 ක් සහිතව විෂයයන් 06 කින් සමත්වී තිබීම.

2. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගනු ලබන හෙදි සහතිකයක් ලබා තිබීම.

•• වැටුප් ක්‍රමය : U-MT 1(III A) : රු.31,625-7x300;10x355-37,275/-(මාසික)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

**තෝරා ගන්නා ක්‍රමය : සම්මුඛ පරීක්ෂණයක් මගිනි**

### 03. පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය

අවශ්‍ය සුදුසුකම් :

1. (අ) ජාතික තාක්ෂණ සහතිකය හෝ සමාන සුදුසුකම් සමග අවුරුදු 03ක පළපුරුද්දක් ලබා තිබීම. (තුන් අවුරුදු පළපුරුද්ද ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව හැදෑරීමේ කාලය තුලදී ලබා තිබීම ප්‍රමාණවත් වේ.

   හෝ

   (ආ) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත්ව තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, සංස්ථාවක හෝ පිළිගත් ආයතනයක අදළ ක්ශේත්‍රයේ පරිපාලකවරයකු වශයෙන් අවුරුදු 05ක පළපුරුද්දක් ලබා තිබීම.

•• වැටුප් ක්‍රමය : U-MT 1(III) : රු.31,625-7x300;10x355-37,275-(මාසික)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

### 04 සැලසුම් ශිල්පී (පහළ ශ්‍රේණිය)

.

අවශ්‍ය සුදුසුකම් :

(I) පිළිගත් රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක සැළසුම් ශිල්පය පිළිබඳ විභාගය සමත්ව තිබිම.

**පහත දක්වා ඇති කරුණු සපුරාලන අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.**

(1) යාන්ත්‍රික සැලසුම් ශිල්පියෙකු විය යුතුය.

(2) NVQ Level 04 හෝ ඊට වැඩි විය යුතුය.(සැලසුම් ශිල්පී පුහුණුව අනිවාර්ය වේ.)

(3) අතින් ඇදීම පිළිබඳව පළපුරුද්ද (Mannual Draughting)

(4) සැලසුම් ශිල්පය පිළිබඳ පරිගණක මෘදුකාංග හා මෙවලම් භාවිතා කිරීම පිළිබඳ දැනුම හා පළපුරුද්ද.(Computer aided draughting tools)

(5) ඉංග්‍රීසි භාෂාවෙන් උපදෙස් දීමේ හැකියාව අමතර සුදුසුකමක් වේ.

•• වැටුප් ක්‍රමය : U-MT 1(III A) :රු.31,625-7x300;10x355-37,275/-(මාසික)

වයස : අවුරුදු 45ට නොවැඩි විය යුතුයි

**තෝරා ගන්නා ක්‍රමය : – වෘත්තීය පරීක්ෂණයක්/ප්‍රායෝගික පැවරුමක් /සම්මුඛ පරීක්ෂණයක් මගිනි**

**•• මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව හා අනුමත අනෙකුත් දීමනාවන් ද ගෙවනු ලැබේ.**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහතික කරන ලද අදල සහතිකපත් සමග 2021.02.05 වන දින හෝ ඊට පෙර මෙම විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි/ආයතන(අනධ්‍යයන) වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

තවද මේ සඳහා අදළ ආදර්ශ අයදුම්පත්‍රය මෙම විශ්වවිද්‍යාලයේ ආයතන (අනධ්‍යයන) අංශයේ, සහකාර ලේඛකාධිකාරි නමට. තම ලිපිනය ලියූ හා මුද්දර ඇලවූ 25.5 සෙ.මී.x 10 සෙ.මී. ප්‍රමාණයේ ලිපි කවරයක් එවීමෙන් හෝ පැමිණ හෝ මොරටුව විශ්වවිද්‍යාලයේ www.mrt.ac.lk. වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් අදළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවීමට කටයුතු කළයුතු වේ.

**ප්‍රමාද වී ලැබෙන, අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා වුවද එම අයදුම්පත නැවත සැළකිල්ලට භාජනය කරනු නොලැබේ.**

මෙම තනතුරු සඳහා ලිඛිත/ප්‍රායෝගික/වෘත්තීය/යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාවය පදනම්ව සුදුස්සන් බඳවාගනු ලැබේ.

ලේඛකාධිකාරි,
මොරටුව විශ්වවිද්‍යාලය,
මොරටුව.

2021.01.13